**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති**
**අමාත්‍යාංශය**

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 17ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

සහ

කළමනාකරණ ක්ෂේත්‍රයට අදාලව පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (එක්සත් රාජධානිය) (CIMA) වැනි පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Fellow Membership)

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සුදුසුකම්

හෝ

අදාල ක්ෂේත්‍රයේ වසර 05ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ 1 ශ්‍රේණියේ සේවා පළපුරුද්ද

සහ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (එක්සත් රාජධානිය) (CIMA) වැනි පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Fellow Membership)

වැටුප් පරිමාණය : HM 1-3-2016 : Rs. [86,865.00 - 15X2,270 - 120,915]

වයස : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 2. කළමනාකරු - හිමිකම්

**බාහිර අයදුම්කරුවන් (1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් රක්ෂණය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණ / මූල්‍ය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යා හෝ තනතුර අයත් විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

   සහ

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම ලබා තිබීම

   හෝ

   පිළිගත් වරලත් වෘත්තීය රක්ෂණ ආයතනයක් වෙතින් ආයතනික සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද
2. පිළිගත් වරලත් වෘත්තීය රක්ෂණ ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Fellow Membership)

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ විෂය ක්ෂේත්‍රයේ මධ්‍ය කළමනාකරණ මට්ටමේ (MM) I ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

වැටුප් පරිමාණය : HM 1-2-2016: Rs.[81,670 - 15 X2,270 - 115,720]

වයස : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 3. සහකාර කළමනාකරු - ප්‍රතිරක්ෂණ

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් රක්ෂණය හා අවදානම් කළමනාකරණ / ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණ/ වාණිජ්‍ය / මූල්‍ය / කළමනාකරණ හෝ රක්ෂණ හෝ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) I ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

වැටුප් පරිමාණය : MM 1-2-2016: Rs.[54,550 - 10 X 1,375 - 15 X 1,910 - 96,950]

වයස : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**කොන්දේසි**

සියලුම අයදුම්කරුවන්,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

පත්වීම් : මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකු නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමග එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො : 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2024.04.15 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02.**